# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 02 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 01 වන දින]

එල්.ඩී.—ඕ. 11/2008.

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතේ 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1985 අංක 21 දරන පනතේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එහි (එ) ඡේදයේ "තෝරාගනු ලබන ආයෝජනවල ආයෝජනය කිරීමට" යන වචන වෙනුවට "තෝරා ගනු ලබන ආයෝජනවල ආයෝජනය කිරීමට," යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (එ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:—

"(ඒ) සේවා නියුක්තිය සඳහා එතෙර යන යම් තැනැත්තකු පනත යටතේ නියමිත ලියාපදිංචිය ලබා නොගෙන එතෙර යන බවට විශ්වාස කිරීමට නිලධරයන්ට හේතු ඇති අවස්ථාවක, පනතට අනුකූලව ලියාපදිංචිය ලබා ගෙන ඇද්ද යන කරුණ නිශ්චය කිරීමේ කාර්යය සඳහා ගොඩබසින යම් ගුවන් තොටුපලක දී හෝ වරායක දී සේවා නියුක්තිය සඳහා එතෙර යන තැනැත්තකුගේ සහතිකයේ ඇති යම් ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා කාර්යාංශයේ නිලධරයන්ට බලය පැවරීම ; සහ

(ඔ) ශ්‍රී ලංකා සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා එතෙර සිටින සේවා යෝජකයන්ගෙන් සමාජ ආරක්ෂණ බදු ලබා ගැනීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ආ) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) ඉල්ලුම්කරු විසින් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවේ දී, මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දැනටමත් දරන්නේ නම්, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව කිසිදු බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 37අ වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම ප්‍රඥප්තියේ 37අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"අනුමැතියක් නොමැතිව වෙළෙඳ දැන්වීම් ආදිය පළ කිරීම සීමා කිරීම.

37අ. (1) යම් වෙළෙඳ දැන්වීමක් හෝ දැන්වීමක් පළ කිරීම කාර්යාංශය විසින් 37 වන වගන්තිය යටතේ අනුමත කර ඇති බවට තමන් සෑහීමට පත් නොවී, ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස තැනැත්තන්ගෙන් ඉල්ලමින් බලපත්‍රලාභියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද වෙළෙඳ දැන්වීමක් හෝ දැන්වීමක් කිසිම තැනැත්තකු විසින් යම් මාධ්‍යයක මුද්‍රණය කිරීම හෝ පළ කිරීම නැතහොත් මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "බඳවාගනු ලබන" යන වචන වෙනුවට "පිටව" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "බඳවාගනු ලබන" යන වචන වෙනුවට "පිටව" යන වචනය ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රඥප්තියේ 51අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— (ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 51අ වගන්තිය ඇතුළත් කිරීම.)

("කොමිස් මුදල් හා වෙනත් ගෙවීම් අය කිරීම.)

51අ. (1) ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා ලබා ගැනීම සඳහා යම් බලපත්‍රලාභියකු විසින් යම් කොමිස් මුදලක් හෝ වෙනත් ගෙවීමක් නොලබන අවස්ථාවක, බඳවාගනු ලබන තැනැත්තාගෙන් ලියාපදිංචි වීමේ ගාස්තුව ලබා ගැනීමට අමතරව, කාර්යාංශයේ පූර්ව අනුමැතිය ලබාගෙන ඔහු විසින් දැරීමට සිදුවන සත්‍ය වියදම් අය කරගනු ලැබිය හැකි ය. ඉල්ලා ඇති වියදම් අසාධාරණ බවට කාර්යාංශයේ විශ්වාසය වන අවස්ථාවක කාර්යාංශය විසින් 37 වන වගන්තිය යටතේ අනුමැතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) යම් බලපත්‍රලාභියකුට එතෙර සේවා යෝජකයකුගෙන් වියදම් සඳහා ගෙවීම් ලැබී තිබිය දී ඒ ගෙවීම් ලැබුණ බව සඟවමින් ඒ වියදම් ගෙවන ලෙස ඉල්ලා සිටින අවස්ථාවක, ඒ බලපත්‍රලාභියා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභියකුට කාර්යාංශය විසින් අනුමත කරන ලද ගෙවීමක් ලැබුණ අවස්ථාවක, එසේ ලැබුණ මුදල සඳහා බලපත්‍රලාභියා විසින් ලදුපතක් නිකුත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය ප්‍රකාරව ලදුපතක් නිකුත් නොකරන බලපත්‍රලාභියකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.)

"(5) කාර්යාංශයේ මතය අනුව, බලපත්‍රලාභියකු විසින් (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන වාර්තාවල

කොමිස් මුදල වශයෙන් ලැබුන බවට හෙළිකර ඇති මුදල සාධාරණ නොවන සහ කොමිස් මුදල වශයෙන් ලැබිය යුතු මුදලට වඩා අඩු මුදලක් වන අවස්ථාවක, (4) වන උපවගන්තිය යටතේ තක්සේරු කිරීමේ කාර්යය සඳහා කොමිස් මුදල විය යුත්තේ සේවා නියුක්තියේ ස්වභාවය සහ අනුයෝජිතයන්ට ලැබිය හැකි ප්‍රතිලාභවල ප්‍රමාණය සලකා බලා අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල වන්නේ ය.

(6) (3) වන උපවගන්තිය යටතේ සෙස් බද්ද ගෙවීම් බලපත්‍රලාභියකු විසින් පැහැර හරින අවස්ථාවක හෝ සෙස් බද්දට අදාළව (4) වන උපවගන්තිය යටතේ කාර්යාංශය විසින් බලපත්‍රලාභියාට අදාළව තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක, කොමිස් මුදල් ප්‍රමාණය, ලැබිය යුතු කොමිස් මුදලට වඩා අඩුවන විටෙක බලපත්‍රලාභියා වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු දඩයකට ඔහු යටත් විය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින්, ඊට අමතරව, පැහැර හැර ඇති සෙස් බදු ප්‍රමාණය ගෙවන ලෙස ද එම බලපත්‍රලාභියාට නියම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (3) වන උපවගන්තියේ ඇති "සෑම බලපත්‍රලාභියකු ම සංගමයේ සාමාජිකයකු විය යුතු ය." යන වචන වෙනුවට "යම් බලපත්‍රලාභියකුහට සංගමයේ සාමාජිකයකු විය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "නියම කර ඇති යම් වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ගැනීම" යන වචන වෙනුවට "නියම කර ඇති, විදේශ නියුක්තියට අදාළ යම් ලේඛන සහ වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවා ගැනීම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 60ආ, 60ඇ සහ 60ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට 60ආ, 60ඇ සහ 60ඈ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"කාර්යාංශයේ නිලධරයන් හා සේවකයන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කාර්යය සඳහා රජයේ නිලධරයන් ආදී වශයෙන් සලකනු ලැබිය යුතු බව.

60ආ. කාර්යාංශයේ සෑම නිලධරයකු සහ සේවකයකු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා—

(අ) රජයේ නිලධරයකු ; සහ

(ආ) සාම නිලධරයකු ලෙස,

සලකනු ලැබිය යුතු ය.

කාර්යාංශයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

60ඇ. කාර්යාංශයේ සෑම නිලධරයකු සහ සේවකයකු ම (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු පැවරීමෙන් මුක්තිය.

60ඈ. (1) (අ) මේ පනත යටතේ කාර්යාංශය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා කාර්යාංශයට එරෙහිව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ කාර්යාංශයේ විධානය මත කාර්යාංශයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා කාර්යාංශයේ එවැනි යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට එරෙහිව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරිපිට දී කාර්යාංශය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශයට උපචිත වූ යම් වියදම් කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කාර්යාංශය වෙත ගෙවන ලද හෝ කාර්යාංශය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තුවක් කාර්යාංශයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් එක් දහසකට නොවැඩි" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයකට නොඅඩු දඩයකට සහ අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් විසි දහසකට නොඅඩු" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයකට නොඅඩු දඩයකට සහ අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොඅඩු දඩයකට සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචනවල සිට "යටත් විය යුතු ය" යන්න දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් පනස් දහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" සහ "රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" සහ "රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් පන් දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ "රුපියල් එක් දහසකට නොඅඩු" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "රුපියල් විසිපන් දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක්" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 67ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 67ආ වගන්තිය ඇතුළත් කිරීම.

"වරදකට ආධාර හා අනුබල දීම.

67ආ. මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කිරීමෙහි ලා බලපත්‍රලාභියකුට හෝ ඔහුගේ

සේවානියුක්තයකුට ආධාර කරන හෝ අනුබල දෙන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහස නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට, 69අ සහ 69ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 69අ සහ 69ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

“සිරභාරයට ගැනීමේ බලතල.

69අ. 37අ, 62, 63 හෝ 64 යන වගන්ති යටතේ යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක හෝ එවැනි වරදක් සිදු කිරීමෙහි ලා යම් තැනැත්තකු වරදකරු බවට සාධාරණ සැකයක් පවතින අවස්ථාවක එම තැනැත්තා ගොඩබිම හෝ ජලය මත යම් ස්ථානයක දී යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත් කාර්යය සඳහා කාර්යාංශය විසින් බලය පවරන ලද කාර්යාංශයේ සේවානියුක්තයකු විසින් එම තැනැත්තා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර, එසේ සිරභාරයට ගනු ලැබූ සෑම තැනැත්තෙක් ම—

(i) නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා වහාම මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; හෝ

(ii) එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක, නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා වහාම ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත භාර දිය යුතු ය.

දඩ මුදල් වලින් යම් කොටසක් කාර්යාංශයේ කම්කරුවන්ගේ සුභ සාධක අරමුදලට යැවිය යුතු බව.

69ආ. (1) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ යම් දඩ මුදලක් පනවනු ලැබූ අවස්ථාවක, එසේ පනවා අයකර ගනු ලැබූ දඩ මුදලින් සියයට හැත්තෑ පහක් පනතේ 45 වන වගන්තිය යටතේ පිහිටුවන

ලද කාර්යාංශයේ කම්කරුවන්ගේ සුභසාධන අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් ලඝු නඩු විභාගයක් පවත්වන මහේස්ත්‍රාත්වරයකු විසින් දණ්ඩන නියමයට අමතරව, පනවා අයකරගනු ලබන දඩ මුදලින් සියයට හැත්තෑ පහක් කාර්යාංශයේ කම්කරුවන්ගේ සුභ සාධක අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු බවට ආඥා කරනු ලැබිය යුතු ය.”.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.